# පශ්චාත් සුනාමි වෙරළ පුනරුත්ථාපන සහ සම්පත් කළමනාකරණ වැඩසටහන - 2012

## 1. මතය

-----

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම් හේතුවෙන් ඇතිවන බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2012 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌන පූර්ණය කිරීම් වැඩසටහන විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය සහ සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල නියමකර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

----------------------

මූල්‍ය ප්‍රකාශනවලට සහ ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂයේ වැඩසටහන් වියදම රු. 1,014,694,785 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 3,450,434,799 ක් විය. සමාලෝචිත වර්ෂයේ වියදම, ඉකුත් වර්ෂයේ වියදම හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| | විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම 2012 | 2011 | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (i) | සිවිල් වැඩ | 764,342,234 | 661,181,710 | 2,460,173,398 |
| (ii) | වාහන, උපකරණ සහ යාත්‍රා | 2,975,066 | 17,157,553 | 197,221,635 |
| (iii) | තාක්ෂණික ආධාර සහ අධ්‍යයන | 7,145,890 | 13,227,070 | 68,275,436 |
| (iv) | පුහුණු සහ වැඩමුළු | 7,221,205 | 26,701,472 | 75,878,271 |
| (v) | සේවා සපයන්නන් සමග කොන්ත්‍රාත් | 28,482,642 | 13,206,661 | 63,317,281 |
| (vi) | අරමුදල් (ආපසු නොගෙවන ආධාර) | 27,241,939 | 5,595,500 | 32,837,439 |
| (vii) | වර්ධක ණය | 111,122,074 | 13,948,608 | 125,070,682 |
| (viii) | වැටුප් හා දීමනා | 42,821,125 | 43,078,585 | 204,296,637 |
| (ix) | මෙහෙයුම් හා නඩත්තු | 23,342,610 | 20,690,778 | 106,464,936 |
| (x) | කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතන ප්‍රදාන වියදම් | නැත | 31,933,746 | 116,899,084 |
| | එකතුව | 1,014,694,785 | 846,721,683 | 3,450,434,799 |

## 2.2 විශේෂ (ඩොලර්) ගිණුම

මුල්‍ය ප්‍රකාශනවලට සහ ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය තුළදී, විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් හා 2012 දෙසැම්බර් 31 දිනට ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 79,388 | 9,042,457 |
| එකතු කලා | | |
| ඌන පූර්ණයන් | 4,039,140 | 518,434,311 |
| විදේශ විනිමය ලාභය | - | 6,577,211 |
| | 4,118,528 | 534,053,979 |
| අඩුකලා | | |
| ආපසු ගැනීම් | 3,786,525 | 491,836,206 |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 332,003 | 42,217,773 |

## 3. විගණන නිරීක්ෂණ

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) විදේශ ගමන්

---------------

(i) 2011 නොවැම්බර් මස හොංකොං හි පැවති උසස් මිලදී ගැනීම් කුසලතා පුහුණු පාඨමාලාව සඳහා සහභාගී වීමේදී ආර්ථිකමය භාවයකින් යුතු ගමන් වැඩසටහනක් තෝරා නොගැනීම හේතුවෙන් රු.717,763 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ii) වැඩසටහන් කාර්යයන්ට සම්බන්ධතාවයක් නොමැති පාඨමාලා 2 ක් සඳහා නිලධාරීන් 05 දෙනෙකුගෙන් විදේශ ගමන් වෙනුවෙන් රු. 2,017,638 ක් ගෙවා තිබුණි. විස්තර පහත දැක්වේ.

| පාඨමාලාවේ නම | | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | දරා තිබූ වියදම |
|---|---|---|---|
| | | | රු. |
| (1) | ප්‍රතිඵල පාදක කළමනාකරණය ක්‍රියාත්මක කිරීම සහ කාර්ය සාධන දර්ශක පිළිබඳ සම්මන්ත්‍රණය - ක්වාලාලම්පූර්, මැලේසියාව 2011 ඔක්තෝබර් | 03 | 1,118,226 |
| (2) | ධීවර කමිටුවේ (COFI) 13 වන සැසියේ රැස්වීම හා කෘ.සං.ජා.අ. ප්‍රධාන කාර්යාලය සමඟ සාකච්ඡාව - රෝමය, ඉතාලිය, 2012 ජූලි | 02 | 899,412 |
| | | 05 | 2,017,638 |

(iii) 2010 ඔක්තෝබර් 11 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2010/01 හි 6.11 ඡේදයට පටහැනිව 2011 හා 2012 වර්ෂ වලදී විදේශ ගමන් වාර 02 ක් සඳහා දෙවන ගණය යටතේ සලකනු ලබන නිලධාරීන් පළමු ගණයේ නිලධාරීන් ලෙස සලකා සංයුක්ත දීමනා ගෙවීම හේතුවෙන් එ.ජ.ඩො. 2640 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) 2011 ඔක්තෝබර් 31 සිට නොවැම්බර් 18 දක්වා ක්වාලාලම්පූර්හි පැවති භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන පාඨමාලාව සඳහා සහභාගී නොවූ නිලධාරියෙකු වෙනුවෙන් පාඨමාලා ගාස්තු ලෙස රු.722,215 (එ.ජ.ඩො.6500) ක් ගෙවා තිබුණි.

(ආ) ත්‍රිකුණාමලය තොග මත්ස්‍ය වෙළෙඳපල ඉදිකිරීමේදී කඩා ඉවත් කරන ලද පැරණි ගොඩනැගිල්ලට අදාලව **ලංකා** ධීවර සංස්ථාව විසින් ගෙවිය යුතු හිඟ ජල ගාස්තු රු.974,869 ක් වැඩසටහන් අරමුදල් මගින් පියවා තිබූ අතර අදාල මුදල් ලංකා ධීවර සංස්ථාවෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ත්‍රිකුණාමලය සහකාර ධීවර අධ්‍යක්ෂ කාර්යාලය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා අදාල කාර්ය සාධන හා සුරැකුම් බැඳුම්කර ලබා ගැනීමෙන් අනතුරුව රු. 881,050 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් නදහස් කර තිබුණ ද අදාල සුරැකුම්වල පළිගතහැකිභාවය තහවුරු කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. ඉදිකිරීම් කාර්ය පිරිවිතර වලට අනුකූල නොවූ බැවින් ගිවිසුම අවලංගු කර තිබූ අතර සුරැකුම් සඳහා කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබූ ලියකියවිලි ව්‍යාජ ඒවා වීම හේතුවෙන් එම බැඳුම්කර මුදල් කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) එ.ජ. ඩොලර් 19239.88 ක වියදම් ණය අරමුදලෙන් ප්‍රතිපූර්ණය සඳහා 2012 අගෝස්තු 13 දින ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත 2013 ජූලි 30 දින දක්වා ද ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ඉ) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට භාරදෙන ලද රු. 409,340 ක් වටිනා වත්කම් භාර දීමේ ලිපි හෝ ලැබීම් තහවුරු කිරීම් විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

4. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------------

4.1 **අරමුදල් උපයෝජනය**

-----------------------

(අ) මූල්‍යායනය හා සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂය තුල අරමුදල් උපයෝජනය හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය සම්බන්ධයෙන් වූ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| | ලබා දීමට එකඟ වූ මුදල් | | 2012 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2012 වර්ෂය තුළ අරමුදල් උපයෝජනය | 2012 දෙසැම්බර් 31 දක්වා උපයෝජිත අරමුදල් |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. (මිලියන) | ශ්‍රී.ල.රු. (මිලියන) | රු. (මිලියන) | රු.(මිලියන) | රු. (මිලියන) |
| කෘ.සං.ජා.අ. | 31.30 | 3,380.02 | 1,050.00 | 1,004.62 | 3,147.98 |
| ශ්‍රී.ලං.ර. | 4.37 | 471.96 | 25.20 | 25.17 | 142.52 |
| ප්‍රතිලාභීන් | 0.42 | 45.67 | - | - | 20.78 |
| එකතුව | 36.09 | 3,897.65 | 1,075.20 | 1,029.79☆ | 3,311.28☆ |

☆ ප්‍රතිපූරණය අපේක්ෂාවෙන් ඇති අගයන් හේතුවෙන් මෙම සංඛ්‍යා 4.1 ජේදයේ සඳහන් සංඛ්‍යා වලින් වෙනස් වේ.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට මුළු වැඩසටහන් අරමුදල් උපයෝජනය ප්‍රතිශතයන් වශයෙන් ණය අංක 664 එල්කේ යටතේ සියයට 97.9 ක් ද ණය අංක 693 එල්කේ සඳහා සියයට 70.8 ක් ද විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ණය අංක 693 එල්කේ යටතේ සූක්ෂම පරිමාණ ව්‍යවසායයන්ට ලබාදීම සඳහා එ.ජ.ඩො. මිලියන 2.09 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණ ද වැඩසටහන ආරම්භ කර වර්ෂ 7 ක් ගත වූ පසුව ද මෙම ප්‍රතිපාදනය උපයෝජනය කර නොතිබුණි.

(ii) කාන්තා සූක්ෂම පරිමාණ ව්‍යවසාය කාර්යයන් සඳහා ආපසු නොගෙවනු ලබන ආධාර ලෙස ණය අංක 664 එල්කේ යටතේ එ.ජ.ඩො. මිලියන 0.67 ක් හා ණය අංක 693 එල්කේ යටතේ එ.ජ.ඩො. මිලියන 2.09 ක් ලෙස වෙන් කර තිබූ අරමුදල් වලින් 2012 දෙසැම්බර් 31 දිනට පළිවෙලින් සියයට 28.8 ක් හා සියයට 42.5 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(iii) වැඩසටහන් කාලපරිච්ජේදයෙන් සියයට 90 ක් ඉක්මවූ පසුව ද ණය අංක 693 එල්කේ යටතේ සමහර සංරචක සඳහා ප්‍රතිපාදනය කර තිබූ අරමුදල් අඩුවෙන් උපයෝජනය කර තිබූ අතර මෙම සංරචකයන් වල ඇතුළත් කාර්යයන් අනුව ඒවා අනෙකුත් සංරචකයන්ගේ සාර්ථකත්වය කෙරෙහි ද බලපානු ලබන බැවින් ඒවායේ මෙම දුර්වලතාවයන් අනෙකුත් සංරචකයන්ගේ කාර්ය සාධනයන් කෙරෙහි ඉහල මට්ටමෙන් බලපා තිබුණි. විස්තර පහත දැක්වේ.

| සංරචකය | ප්‍රතිපාදිත මුදල | 2012 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය | උපයෝජනයේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | එ.ජ.ඩො. | එ.ජ.ඩො. | % |
| වාහන, උපකරණ හා යාත්‍රා | 491,700 | 6,096 | 1.24 |
| තාක්ෂණික සහාය හා අධ්‍යයන | 298,000 | 16,609 | 5.57 |
| පුහුණු හා වැඩමුළු | 298,000 | 28,803 | 9.66 |
| | 1,087,700 | 51,508 | 16.47 |

(ඇ) **භෞතික කාර්ය සාධනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ස්ත්‍රී / පුරුෂ භාවය පළිබඳ ප්‍රතිපත්ති සහාය සහ වැඩසටහන් කළමනාකරණ සංරචකය යටතේ වූ ස්ත්‍රී / පුරුෂ භාවය පිළිබඳ සංවර්ධනය යන ක්‍රියාකාරකමෙහි භෞතික කාර්ය සාධනය 2012 දෙසැම්බර් 31 දිනට සියයට 10 ක් විය.

(ii) ව්‍යාපෘතියේ සංරචක 02 ක් යටතේ වූ ක්‍රියාකාරකම් 4 ක 2012 දෙසැම්බර් 31 දිනට ඉලක්ක ලඟා කර ගැනීම් ප්‍රතිශතය සියයට 40 සිට සියයට 67 ක් පමණක් විය. විස්තර පහත දැක්වේ.

| සංරචකය | | ක්‍රියාකාරකම් | ඉලක්ක | තථ්‍ය | ලඟා කර ගැනීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | | | | % |
| i. සුළු පරිමාණ ව්‍යවසායකයන් සහ මූල්‍ය සේවා සංවර්ධනය | (i) | සුළු පරිමාණ ව්‍යාවසාය සඳහා දිස්ත්‍රික් වැඩසටහන් කළමනාකරණ ඒකක තුලින් තාක්ෂණික පුහුණුව (පුද්ගලයින්) | 600 | 400 | 66.7 |
| | (ii) | ප්‍රතිලාභීන්ට ආරම්භක ආධාර සැපයීම් (පුද්ගලයින්) | 1500 | 600 | 40 |
| | (iii) | කාන්තා සමූපකාර බැංකු හරහා කාන්තා ඉතිරි කිරීම් හා ණය වැඩි කිරීම් (පුද්ගලයින්) | ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| ii. සමාජය හා ආර්ථික යටිතල පහසුකම් | | නිවාස අවශ්‍යතා සැපයීම (ඒකක) | 100 | 60 | 60 |